කර්මාන්ත අමාත්‍යාංශය

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

තනතුරු පුරප්පාඩු – ප්‍රධාන කාර්යාලය/පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ

01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) Deputy General Manager (Finance)

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණන (HM - 1-3)

පුරප්පාඩු පවතින ස්ථානය - ප්‍රධාන කාර්යාලය - තනතුරු - 01

බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය හා ගිණුම් ක්ෂේත්‍රය පිළිබඳව උපාධියක් ලබා තිබීම.

සමඟ

මූල්‍ය හා ගිණුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ වරලත් ගණකාධිකාරී ආයතනය/ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය/ වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය (ICA/ CIMA/ ACCA) ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමඟ ඉහා යහපත් සේවා වාර්තාවක් තිබීම.

(ආ) වරලත් ගණකාධිකාරී ආයතනය/ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය/ වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ පූර්ණ සාමාජිකත්වය (ICA/ CIMA/ ACCA) ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 17 ක පළපුරුද්දක් සමඟ ඉහා යහපත් සේවා වාර්තාවක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM-1-1) සේවා ගණයෙහි අවම වශයෙන් වරස 02 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. කළමනාකාර (MM-1-1) සේවා ගණයෙහි තනතුරක 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 07 අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM-1-3, සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - HM-1-3, රු. 86,865/- 2,270X15-120,915/-

රු. 86,865/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

HM-1-3 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් අමතර දීමනාවන්ද හිමිවේ.

1. PED/1/2015,PED/1/2015(i) හා PED/1/2015(ii) යන චක්‍ර ලේඛ ප්‍රකාරව ප්‍රවාහන දීමනාවන් හෝ රාජකාරී කටයුතු සඳහා ආයතනයේ වාහනයක් යන දෙකෙන් එකක් ලබාදීම.
2. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම.
3. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රීය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

02. ප්‍රධාන රසඥ - (Chief Chemist)

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM-1-1)

(පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

(1) අධ්‍යාපන සුදුසුකම්/ වෘත්තීය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

සමඟ

රසායන විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් නාක්ෂණ ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ ඉහා යහපත් සේවා වාර්තාවක් තිබීම.

(2) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

පළපුරුද්ද - රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ ඉහා යහපත් සේවා වාර්තාවක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර (MM-1-1) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM-1-1, සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - HM-1-1, රු. 80,295/- 2,270X15-114,345/-

රු. 80,295/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

HM-1-1 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් අමතර දීමනාවන්ද හිමිවේ.

1. PED/1/2015,PED/1/2015(i) හා PED/1/2015(ii) යන චක්‍ර ලේඛ ප්‍රකාරව ප්‍රවාහන දීමනාවන් හෝ රාජකාරී කටයුතු සඳහා ආයතනයේ වාහනයක් යන දෙකෙන් එකක් ලබාදීම.
2. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම.
3. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රීය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

03. සිවිල් ඉංජිනේරු - (Civil Engineer)

කළමනාකාර සේවා ගණය (MM-1-1)

(පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්.

පහත සඳහස් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (සිවිල්) උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද.

2. සිවිල් කටයුතු පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය ප්‍රහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර (JM1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM-1-1, සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - MM-1-1, රු. 53,175/- 1,375X10,1,910X15-95,575/-

රු. 53,175/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

04. අභ්‍යන්තර විගණක - (Internal Auditor)

කළමනාකාර සේවා ගණය (MM-1-1)

(පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය/ ගිණුම්/ වාණිජවේදී පිළිබඳව ලබාගත් උපාධියක්

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල / හෝ පිළිගත් ආයතනයක කළමනාකරණ මට්ටමේ මූල්‍ය ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද.

හෝ

02. (i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය (Intermediate level of Institute of Chartered Accountants of Sri Lanka - ICASL)

(ii) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය (Institute of Management Accounts CIMA Internediate Level)

(iii) වරලත් පිරිවැය ගණකාධිකාරී ආයතනයේ (Association of Certificate and Corporate Accounts - ACCA) II වන අදියර

(iv) රාජ්‍ය කාර්මික විද්‍යාලය මගින් ලබාදෙනු ලබන උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමා / උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව (HNDA/ HNDC)

සහ

ඉහත 2 යටතේ කුමන හෝ සුදුසුකමක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්මේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ හෝ පිළිගත් ආයතනයක මූල්‍ය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) කනිෂ්ඨ කළමනාකාර (JM1-2) සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

MM-1-1, සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - MM-1-1, රු. 53,175/- 1,375X10, 1,910X15 -95,975/-

රු. 53,175/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

MM-1-1 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් අමතර දීමනාවන්ද හිමිවේ.

1. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම.
2. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රීය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

05. ගිණුම් නිලධාරී - (Accounts Officer)

කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM-1-2)

(පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය - තනතුරු - 01)

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ගිණුම්/ වාණිජවේදී පිළිබඳව ලබාගත් උපාධියක්
2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය (Intermediate level of Institute of Chartered Accountants of Sri Lanka - ICASL)
3. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (Chartered Institute of ManagmentsAccounts CIMA) අන්තර් මධ්‍ය පරීක්ෂණය
4. වරලත් පිරිවැය ගණකාධිකාරී ආයතනයේ (Associetion of Certificate and Corporate Accounts - ACCA) II වන අදියර
5. රාජ්‍ය කාර්මික විද්‍යාලය මගින් ලබාදෙනු ලබන උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමා / උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව (HNDA/ HNDC)

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) කළමනාකාර සහකාර නාක්ෂණික නොවන (MA-1-1) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ හි තනතුරක් අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

JM-1-2, සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - JM-1-2, රු. 43,355/- 755X10, 1,135X18 -71,335/-

රු. 43,355/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

06. මුදල් අයකැමි (Cashier)

කළමනාකරණ සහකාර නාක්ෂණික නොවන සේවා ගණය (MA-1-1)

පුරප්පාඩු පවතින ස්ථානය - ප්‍රධාන කාර්යාලය - තනතුරු 01

බාහිර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබීම.

අධ්‍යාපන සුදුසුකම්

(1) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ විභාගයේදී)

I සිංහල / දෙමළ

II ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම. **හා**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සමඟ

තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් : පරිගණක වදන් සැකසුම්/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(1) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත "අ", "ආ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I සිංහල / දෙමළ

II ගණිතය

ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

හා

පරිගණක වදන් සැකසුම්/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

(ආ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීමවල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක් යටත් පිරිසෙයින් අවුරුදු 03 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

MA-1-1 සේවා ගණයට අදාළ වැටුප් ක්‍රම අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍ර ලේඛ 02/2016 අනුව

වැටුප් ක්‍රම අංකය - MA-1-1, රු. 27,910/- 300X10, 350X7, 495X4, 660X20 - 48,540/-

රු. 27,910/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

HM-1-3, HM-1-1 සේවා ගණයේ තනතුරු සඳහා වයස් සීමාව - අවුරුදු 35 නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

MM-1-1, JM-1-2 සේවා ගණයේ තනතුරු සඳහා වයස් සීමාව - අවුරුදු 22 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

MA-1-1 සේවා ගණයේ තනතුරු සඳහා වයස් සීමාව - අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

ගෙවනු ලබන මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා හා ප්‍රතිලාභ ඉහත තනතුරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) (HM-1-3) ප්‍රධාන රසඥ (HM-1-1), සිවිල් ඉංජිනේරු (MM-1-1), අභ්‍යන්තර විගණක (MM-1-1), ගිණුම් නිලධාරී (JM-1-2) මුදල් අයකැමි (MA-1-1) යන තනතුරු සියල්ල සඳහාම හිමිවේ.

දීමනා

01. භාණ්ඩාගාරය අනුමත කළ රු. 7,800/- වන ජීවන වියදම් දීමනාව.
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරි දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු. 4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව.
06. රු. 5,000/- වන මාසික අත්කර්දීමනාව.
07. රු. 15,000/- වන ඉංජිනේරුවන් රඳවා නබා ගැනීමේ දීමනාව (සිවිල් ඉංජිනේරු තනතුර සඳහා පමණි)

ප්‍රතිලාභ

01. වාර්ෂික නිෂ්පාදන දිරිගැන්වීමේ දීමනාව.
02. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
03. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු. 200,000/- ක රෝහල් ගත වීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    ii. වසරක් සඳහා රු. 20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    iii. වසරක් සඳහා රු. 3,000/- දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
04. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය විසඳුම් ලබාදීම.
    i. වසර දෙනකට වරක් රු. 12,000/- ක දීමනාවක් (විශේෂඥ වෛද්‍ය ශාස්තු වෛද්‍ය පරීක්ෂණ ශාස්තු ඇස් කණ්නාඩි හා ශ්‍රවණාධාර වියදම්)
    ii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු. 12,000/- මුදලක් ලබාදීම.
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% ක් ද සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ නාර අරමුදල සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

පොදු කොන්දේසි

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.
4. තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ මූළු ඉපයීම්වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as you Earn Paye Tax) අයකරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් තම අදාළ දෙපාර්තමේන්තුවල / ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත දක්වන ලද තනතුරු සඳහා වන අයදුම්පත් (අදාළ සහතික පත්‍රවල ශායාස්ථ පිටපත්ද සමඟ) ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/21 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2023.01.23 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුවේ.

සභාපති,
ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්,
අංක 341/21, සරණ මාවත රාජගිරිය.

Source: Silumina, Sunday Observer (2023.01.08)